**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**University of Sri Jayewardenepura, Sri Lanka**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**External Degrees and Extension Courses Unit (EDECU)**

මගේ අංකය :
My Number

ඔබේ අංකය :
Your Number

දුරකථන : 2801481, 3132496, 2881777
Telephone

නුගේගොඩ , ශ්‍රී ලංකාව
Nugegoda , Sri Lanka

ෆැක්ස් : 2802753


---

2019.06.28

ගරු ස්වාමීන්වහන්ස
මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියෙනි

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - ශිෂ්‍ය ලියාපදිංචිය 2019**

උක්ත බාහිර උපාධි පාඨමාලාව වෙනුවෙන් 2019.06.02 දින පැවති තෝරාගැනීමේ පරීක්ෂණයෙන් සමත් වී සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීමට කටයුතු කෙරේ.

මේ සඳහා වන පාඨමාලා ගාස්තුව (වර්ෂ 3 සඳහා) රු.100,000.00 ක් වන අතර එය වාරික 3 කින් පළමු වසර සම්පූර්ණ වනවිට ගෙවා නිමකළ යුතුය. මෙම පාඨමාලාවට ලියාපදිංචි වීම සඳහා ලියාපදිංචි ගාස්තුව රු.10,000.00 ක් සහ පාඨමාලා ගාස්තු පළමු වාරිකය රු.40,000.00 ක් 2019.07.27 දිනට පෙර මහජන බැංකුවේ ඔබට අදාළ ගිණුම් අංක වලට ගෙවා පහත සඳහන් ලේඛන වල **මුල් පිටපත් සහ ඡායා පිටපත්** ද රැගෙන **2019.07.28** දින **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සුමංගල ගොඩනැගිල්ල** වෙත පැමිණිය යුතුය. මුදල් ගෙවිය යුතු ගිණුම් අංක ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුළත් කිරීමෙන් බාගත (Download) කළ හැක.

- සම්පූර්ණ කරන ලද ඔබගේ තොරතුරු පත්‍රිකාව ජාතික හැඳුනුම්පත් අංකය ලබා දීමෙන් බාගත (Download) කළ හැක. තොරතුරු පත්‍රිකාව බාගත කරගැනිමෙන් පසු යම් සංශෝධනයක් සිදු කළයුතු වේ යැයි හැඟී ගියහොත් එය බාගත කරගත් තොරතුරු පත්‍රිකාවේ නිවැරදි කර භාරදිය යුතුය. ඉන් පසු පරිගණක දත්ත වැඩසටහනේ එම සංශෝධනය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයෙන් නිවැරදි කරනු ඇත.
- උප්පැන්න සහතිකය
- අ.පො.ස (උසස් පෙළ) සහතිකය හෝ අමතර සුදුසුකම් යටතේ ලියාපදිංචි වන්නේ නම් අදාල සහතික
- වෘත්තීය සුදුසුකම් සනාථ කිරිමට අදාල සේවා සහතිකය
- ජාතික හැඳුනුම්පත (ඡායා පිටපතක් සහිතව)
- නමෙහි වෙනසක් ඇත්නම් දිව්රුම් ප්‍රකාශයක් සහ අදාල ලියකියවිලි
- පාස්පෝට් ප්‍රමාණයේ (සෙ.මී. 3.5 ඃ 4.5) වර්ණ ඡායාරූප තුනක්
- ලියාපදිංචි ගාස්තු රු. 10,000.00 ක මුදල ගෙවන ලද බැංකු රිසිට් පත
- පාඨමාලා ගාස්තු පළමු වාරිකය රු. 40,000.00 ගෙවන ලද බැංකු රිසිට් පත

**සැලකිය යුතුයි -:**

- ඉතිරි පාඨමාලා ගාස්තු වාරික ගෙවිය යුතු දින පසුව දැනුම් දෙනු ලැබේ.

- මෙම පාඨමාලාවේ සම්මන්ත්‍රණ එක් විෂයයකට පැය 40 බැගින් විෂය නිර්දේශය ආවරණය වන පරිදි දේශන පවත්වනු ලබයි. උපාධි වර්ෂයකට අදියර කිහිපයකින් යුතුව සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. ඒ අනුව සති අන්තයේ මෙන්ම සතියේ දිනවලද සම්මන්ත්‍රණ පැවැත්වීමට නියමිතය.

- නර්තනය හා සංගීතය විෂයන් සඳහා සිසුන් තෝරා ගැනීමට ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන අතර එම විෂයන් හැදෑරීමට පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පරීක්ෂණයෙන් අසමත් වන සිසුන් ඒ වෙනුවට වෙනත් විෂයයක් තෝරා ගත යුතුය.

- ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස හැදෑරීම සඳහා ද පරීක්ෂණයක් පවත්වන අතර එම පරීක්ෂණයෙන් සමත් විය යුතුය. (අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂයය හදාරා අවම වශයෙන් 'S' සාමාර්ථයන් ලබා තිබේ නම් පරීක්ණයට පෙනී සිටීම අවශ්‍ය නොවේ.)

- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ජනසන්නිවේදනය විෂය හදාරා තිබිය යුතුය.
- ඔබ විසින් තෝරා ගන්නා ලද විෂයයන් නැවත වෙනස් නොකරන බැවින් උපාධි පාඨමාලාවට අදාළ විෂයයන් පිළිබඳ විස්තර ඇතුලත් විෂය නිර්දේශය හා ශිෂ්‍ය අත්පොත වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අතර එය අධ්‍යයනය කර ඔබට අවශ්‍ය විෂයයන් තෝරා ගැනීම සිදු කළ යුතුය.

ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා **2019.07.28** දින විශ්වවිද්‍යාලයට පැමිණෙන විට අපේක්ෂකයන්ට නියමිත වේලාවක් වෙන්කර ඇත. ඔබගේ අයදුම්පත් අංකයට නියමිත වේලාව, කණ්ඩායම සහ ස්ථානය පහතින් දක්වා ඇත.

ඉහත දිනයේ දී ලියාපදිංචිය සඳහා සහභාගි නොවුනහොත් ලියාපදිංචිය අපේක්ෂා නොකරන අයෙකු ලෙස සළකනු ලැබේ. ඔබට ලියාපදිංචි විය හැක්කේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ එක් බාහිර උපාධි පාඨමාලාවක් සඳහා පමණක් බව අවධාරණය කරමි.

බාහිර උපාධි අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා විශ්වවිද්‍යාලයට පැමිණෙන විට විධිමත් ඇඳුමකින් පැමිණීමට වගබලා ගත යුතු වේ.

**ඉහත පාඨමාලාවට අදාල වන නියමිත අවශ්‍යතා ඔබ විසින් සපුරා නොමැති බව හෙළි වුවහොත් බාහිර උපාධි අපේක්ෂක ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

| කියවීම් ශාලාව - සුමංගල ගොඩනැගිල්ල | | | | | |
|---|---|---|---|---|---|
| **වේලාව** | **A** | **B** | **C** | **D** | **E** |
| පෙ.ව 9.00 - පෙ.ව 10.00 | 26 - 269 | 1194 - 1410 | 2283 - 2439 | 3350 - 3549 | 4505 - 4602 |
| පෙ.ව 10.00 - පෙ.ව 11.00 | 278 - 450 | 1416 - 1708 | 2445 - 2570 | 3550 - 3736 | 4604 - 4751 |
| පෙ.ව 11.00 - ප.ව 12.00 | 457 - 624 | 1709 - 1843 | 2574 - 2717 | 3742 - 3925 | 4752 - 4981 |
| ප.ව 1.00 - ප.ව 2.00 | 629 - 863 | 1846 - 2023 | 2728 - 2960 | 3927 - 4105 | 4985 - 5135 |
| ප.ව 2.00 - ප.ව 3.00 | 864 - 1016 | 2024 - 2168 | 2961 - 3159 | 4109 - 4372 | 5137 - 5336 |
| ප.ව 3.00 - ප.ව 4.00 | 1035 - 1193 | 2170 - 2268 | 3168 - 3345 | 4376 - 4504 | 5346 - 5504 |
| විමර්ශන ශාලාව - සුමංගල ගොඩනැගිල්ල | | | | | |
| **වේලාව** | **F** | **G** | **H** | **I** | **J** |
| පෙ.ව 9.00 - පෙ.ව 10.00 | 5511 - 5733 | 6405 - 6511 | 7452 - 7622 | 8691 - 8886 | 9951 - 10145 |
| පෙ.ව 10.00 - පෙ.ව 11.00 | 5748 - 5899 | 6512 - 6604 | 7625 - 7837 | 8889 - 9103 | 10160 - 10370 |
| පෙ.ව 11.00 - ප.ව 12.00 | 5900 - 6027 | 6606 - 6880 | 7851 - 8044 | 9114 - 9322 | 10378 - 10577 |
| ප.ව 1.00 - ප.ව 2.00 | 6030 - 6144 | 6903 - 7111 | 8045 - 8267 | 9332 - 9530 | 10584 - 10840 |
| ප.ව 2.00 - ප.ව 3.00 | 6148 - 6296 | 7113 - 7295 | 8270 - 8484 | 9531 - 9757 | 10841 - 11016 |
| ප.ව 3.00 - ප.ව 4.00 | 6298 - 6403 | 7301 - 7449 | 8488 - 8682 | 9762 - 9946 | 11017 - 11081 |